OPERATIONS MANAGEMENT (Part-III)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

ස්ථාවර පිරිවැය (Fixed Cost)

කිසියම් නිෂ්පාදන මට්ටමක් තෙක් නිෂ්පාදනය කරනු ලබන ඒකක සංඛ්‍යාව අනුව වෙනස් නොවන පිරිවැය ස්ථාවර පිරිවැය (Fixed Cost) වේ.

නිදසුන් :

- කම්හල් කුලී
- කම්හල් වරිපණම් .

කෙටි කාලයක් තුළ උපරිම ධාරිතාව නිෂ්පාදනය කළ ද, කිසිදු නිෂ්පාදනයක් සිදු නොකළ ද ස්ථාවර පිරිවැය දැරිය යුතුය.

ClassWork.LK

විචල්‍ය පිරිවැය (Variable Cost)

නිෂ්පාදනය කරනු ලබන ඒකක සංඛ්‍යාව අනුව වෙනස් වන පිරිවැය විචල්‍ය පිරිවැය (Variable Cost) වේ.

නිදසුන් :

- සෘජු ද්‍රව්‍ය පිරිවැය
- සෘජු ශ්‍රම පිරිවැය

ClassWork.LK

<u>මුළු පිරිවැය</u>

ස්ථාවර පිරිවැය හා විචල්‍ය පිරිවැයෙහි එකතුව මුළු පිරිවැය වේ.

මුළු පිරිවැය = ස්ථාවර පිරිවැය + විචල්‍ය පිරිවැය

<u>මුළු ආදායම (Total Revenue)</u>

ව්‍යාපාරයක් යම් නිශ්චිත කාලච්ඡේදයක එහි නිෂ්පාදිත අලෙවියෙන් ලබන ආදායම මුළු ආදායම (Total Revenue) වේ.

මුළු ආදායම = විකුණුම් ඒකක ගණන x ඒකකයක විකුණුම් මිල

ClassWork.LK

දායකය

මුළු ආදායමෙන් විචල්‍ය පිරිවැය අඩු කිරීමෙන් දායකය ගණනය කළ හැකි ය. දායකය මුළු දායකය හා ඒකකයක දායකය ලෙස ගණනය කළ හැකි ය.

දායකය = මුළු ආදායම - විචල්‍ය පිරිවැය

ලාභය

මුළු ආදායමෙන් මුළු පිරිවැය අඩු කිරීමෙන් ලාභය ගණනය කළ හැකි ය.

ලාභය = මුළු ආදායම - මුළු පිරිවැය

ClassWork.LK

සමච්ඡේදන ලක්ෂ්‍යය - Break-even point (BEP)

ව්‍යාපාරයක් ලාභ හෝ අලාභ හෝ නොලබන නිෂ්පාදන නොහොත් අලෙවි මට්ටම සමච්ඡේදන ලක්ෂ්‍යයයි. Break-even point (BEP). මෙම ලක්ෂ්‍යයේ දී මුළු ආදායම මුළු පිරිවැයට සමාන වේ.

මෙම ලක්ෂ්‍යයේ විකුණුම් ඒකක ගණන හෝ නිෂ්පාදන ඒකක ගණන හෝ සමච්ඡේද ලක්ෂ්‍යයේ ඒකක ගණන වේ.

ClassWork.LK

සමච්ඡේදන ලක්ෂ්‍යය සමීකරණයක් මගින්

සමච්ඡේදන ලක්ෂ්‍යය සමීකරණයක් මගින් දැක්විය හැකිය.

$$\text{සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක සංඛ්‍යාව} = \frac{\text{මුළු ස්ථාවර පිරිවැය}}{\text{ඒකකයක දායකයත්වය}}$$

$$\text{ඒකකයක දායකය} = \text{ඒකකයක විකුණුම් මිල} - \text{ඒකකයක විචල්‍ය පිරිවැය}$$

ClassWork.LK

නිදසුන :

නිෂ්පාදන ආයතනයක, එක්තරා නිෂ්පාදනයක නිෂ්පාදන ධාරිතාව මසකට ඒකක1000කි. එම නිෂ්පාදිතයට අදාළ අනෙකුත් තොරතුරු පහත පරිදි වේ.

- ඒකකයක විකුණුම් මිල රු. 10 යි
- ඒකකයක විචල්‍ය පිරිවැය රු. 5 යි
- ස්ථාවර පිරිවැය රු. 3000 යි.
- අපේක්ෂිත නිෂ්පාදන ඒකක සංඛ්‍යාව ඒකක 800 යි.

$$\text{සමච්ඡේදන ලක්ෂ්‍යයේ ඒකක සංඛ්‍යාව} = \frac{\text{මුළු ස්ථාවර පිරිවැය (F)}}{\text{ඒකකයක දායකයත්වය (C)}}$$

$$= \frac{3000}{5}$$

$$= \underline{\underline{600 \text{ (ඒකක)}}}$$

$$\text{ඒකකයක දායකය} = \text{ඒකකයක විකුණුම් මිල(s)} - \text{ඒකකයක විචල්‍ය පිරිවැය(v)}$$

$$= 10 - 5$$

$$= \underline{\underline{5 \text{ (රුපියල්)}}}$$

ClassWork LK

සමච්ඡේදන ලක්ෂ්‍ය ප්‍රස්තාරයක් ඇසුරෙන්

සමච්ඡේදන ලක්ෂ්‍ය ප්‍රාස්තාරික ව නිරූපණය කිරීමට පහත පරිදි වගුවක් ගොඩ නගා ගත හැකි ය.

ඒකක ගණන	ඒකකයක මිල	මුලු ආදායම (රු.)	ස්තාවර පිරිවැය (රු.)	විචල්‍ය පිරිවැය (රු.)	මුලු පිරිවැය (රු.)
100	10	1000	3000	500	3500
200	10	2000	3000	1000	4000
300	10	3000	3000	1500	4500
400	10	4000	3000	2000	5000
500	10	5000	3000	2500	5500
600	10	6000	3000	3000	6000
700	10	7000	3000	3500	6500
800	10	8000	3000	4000	7000

ClassWork.LK

සමච්ඡේදන ලක්ෂ්‍යය ප්‍රස්තාරය

සමච්ඡේදන ලක්ෂ්‍යය පහත පරිදි ප්‍රාස්තාරික ව නිරූපණය කිරීම කළ හැකි ය.



සමච්ඡේදන ලක්ෂයය ගණනය කිරීම හා සමච්ඡේදන ලක්ෂයය ප්‍රාස්තාරික ව නිරූපණය කිරීම නිදසුනක් ඇසුරෙන්

නිෂ්පාදනයේ හෝ අලෙවියේ හෝ විවිධ මට්ටම්වල දී ලාභය හෝ අලාභය හෝ පහත පරිදි පෙන්විය හැකි ය.

නිදසුන් :

- නිෂ්පාදන ඒකක 600 දී

  මුළු ආදායම රු. 6000

  මුළු පිරිවැය රු. 6000

  ලාභයක් හෝ අලාභයක් හෝ නොමැත.

- නිෂ්පාදන ඒකක 400 දී

  මුළු ආදායම රු. 4000

  මුළු පිරිවැය රු. 5000

  අලාභය රු. 1000

- නිෂ්පාදන ඒකක 700 දී

  මුළු ආදායම රු. 7000

  මුළු පිරිවැය රු. 6500

  ලාභය රු. 500

ClassWork.LK

සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ ප්‍රයෝජන

- ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම සඳහා පිරිවැය ලාභය හා නිෂ්පාදන ප්‍රමාණය පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කළ හැකි වීම.

- නිෂ්පාදන සැලසුම්කරණයට මෙන් ම මිල නියම කිරීමේ දී ද ප්‍රයෝජනවත් වීම.

- ව්‍යාපාර ආදායම, පිරිවැය සහ මිල යන අංශවල ඇති වන වෙනස් වීම් විග්‍රහ කළ හැකි වීම.

- නිමැවුමේ හෝ අලෙවියේ හෝ විවිධ මට්ටම්වල දී ලාභය හෝ අලාභය හෝ පෙන්නුම් කළ හැකි වීම.

- ආරක්ෂිත ආන්තිකය සොයා ගැනීමෙන් විකුණුම් පහත වැටීමේ අවදානම් ස්වරූපය තේරුම් ගත හැකි වීම.

ClassWork.LK

සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ සීමා

- සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහය කෙටි කාලීන තීරණ ගැනීමේ දී වැදගත් සාධකයක් වූවත් දිගු කාලීන තීරණ ගැනීමේ දී යොදා ගැනීම සාර්ථක නොවේ.

- සමච්ඡේදන ලක්ෂ්‍ය විග්‍රහයේ දී ඇති කර ගන්න උපකල්පන මගින් ඇති කරන සීමා.

නිදසුන් :

කෙටි කාලයක දී නිෂ්පාදන හෝ විකුණුම් හෝ ඒකක ගණන අනුව ස්ථාවර පිරිවැය වෙනස් නොවුණ ද දිගු කාලයේ දී වෙනස් විය හැකි ය.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura